# 08 රක්ෂණය

## ව්‍යාපාර අධ්‍යයනය

### අ. පො. ස. උසස් පෙළ

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය |
| --- | --- |
| 8.1 ව්‍යාපාර වල පැවැත්මට හේතුවන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි | • රක්ෂණය<br>  • අර්ථ දැක්විම<br>• අවදානම<br>  • අර්ථ දැක්විම<br>  • රක්ෂනය කල හැකි අවදානම්<br>  • රක්ෂනය කල හැකි නොහැකි අවදානම්<br>• රක්ෂණයේ අවශ්‍යතාවය<br>• රක්ෂණ ගිවිසුම්<br>• රක්ෂණ ගිවිසුමට සම්බන්ධ පාර්ශව<br>• රක්ෂණ ඔප්පුව |

සැකසුම - සමන් රණසිංහ ර/උඩගම මහා විද්‍යාලය

LIVEWORKSHEETS

රක්ෂණයේ ඉතිහාසය පිළිබඳ අවබෝදයක් ලබා ගැනීම සඳහා මෙම වීඩියෝව නරඹන්න

LIVEWORKSHEETS

# අවදානම

**රක්ෂණය කරනු ලබන්නේ අවදානම්ය.**

**අවදානම් යනු රක්ෂණයේදී මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකි හානියක් සිදු වීමට ඇති ඉඩකඩයි.**


**වියාපාර කටයුතු කරගෙන යාමේදී විවිධාකාර අවධානම් සිදුවිය හැකිය**

**නිදසුන්**

- ❖ ව්‍යාපාරය ගිනි ගැනීම
- ❖ සොරසතුරු උවදුරු
- ❖ ව්‍යාපාරය පාඩු ලැබීම
- ❖ ව්‍යාපාරයේ දේපලවලට සිදුවිය හැකි හානි

LIVEWORKSHEETS

අවදානම් වර්ග 02 කට බෙදිය හැක.




## රක්ෂණය කළ හැකි අවදානම් වල ලක්ෂණ

- ✶ අනාගතයේ සිදුවිය හැකි අලාභ මූල්‍යමය වශයෙන් මැනිය හැකි වීම.
- ✶ අවධානම නියත නොවිය යුතුය.
- ✶ සම්බන්ධතාවයෙන් තොර වීම.
- ✶ එනම් සිදු වූ පාඩුව වෙනත් රක්ෂිත හා සම්බන්ධ නොවිය යුතුය.
- ✶ සත්‍යාපනය කළ හැකි වීම.

## රක්ෂණය කල හැකි අවදානම් සඳහා උදාහරණ

- ☐ ගොඩනැගිලි ගිනි ගැනීම මගින් සිදු වන අවදානම්
- ☐ රථවාහන අනතුරු අවදානම්
- ☐ මාර්ගස්ථ මුදල්වලට සිදු වන හානි
- ☐ ණයගැතියකු ගෙන් ලැබිය යුතු මුදල් නොලැබීමේ අවදානම

LIVEWORKSHEETS

## රක්ෂණය කළ නොහැකි අවදානම් වල ලක්ෂණ

- ✶ විභාග අසමත් වීම.
- ✶ යල් පැනීම , ක්ෂය වීම වැනි ස්වභාවික හේතූන් මත ඇතිවන ව්‍යාපාරික අවදානම්
- ✶ වැරදි කළමණාකරණ තීරණ නිසා සිදුවන ව්‍යාපාරික අලාභ.
- ✶ ආදරය අහිමිවීම වැනි පුද්ගල හැකියාව මත තීරණය වන අවධානම්

## රක්ෂණය කල නොහැකි අවදානම් සඳහා උදාහරණ

- ව්‍යාපාරය පාඩු ලැබීම
- ස්වභාවික හේතූන් නිසා ඇති වන අවදානම් (ක්ෂයවීම්, යල්පැනීම්, වාෂ්පවීම් )
- තම හැකියා හා ශක්තිය මත තීරණය වන අවදානම් (විභාග අසමත් වීම, ආදරය අහිමි වීම )
- මෝස්තර වෙනස්වීම් නිසා සිදු වන අවදානම්

රක්ෂණය කල හැකි අවදානම් හඳුනාගැනීම සඳහා භාවිතා කරන නිර්ණායකයක් නොවන්නේ

(1) අවදානම් අහඹු ලෙෂ සිදු විමය

(2) සත්‍යාපනය කල හැකි විම

(3) අවදානම පුරෝකථනය කළ හැකි විම

(4) සම්බන්ධතාවකින් තොර විම

(5) අවදානම විශාල එකක් විම

LIVEWORKSHEETS

ඉහත X තීරුවෙහි රක්ෂණ හා සම්බන්ධ පද කිහිපයක්ද Y තිරුවෙන් ඊට අදාල පැහැදිලි කිරීම් කිහිපයක්ද පහත දැක්වේ ඒ ඒ පද වලට අදාළ පැහැදිලි කිරීම් නිවැරදිව ගලපන්න

| X තීරුව | Y තීරුව |
| --- | --- |
| උපද්‍රව | උපද්‍රවයක් හේතු කොටගෙන රක්ෂිත දේපොළකට සිදුවන පාඑදු වීම |
| අලාභ | අලාභය සිදුවීමට හේතුව |
| අවදානම | සිදුවූ හානිය මුදලින් තක්සේරු කිරීම |
| හානි | මූල්‍යමය අලාභ සිදුවීමට ඇති සම්භවිතාව |

පහත සඳහන් අවදානම් සඳහා ඇති උදාහරණ අතරින් රක්ෂණය කල හැකි හා රක්ෂණය කල නොහැකි අවදානම්ද යන්න තෝරන්න

(1) ණයගැතියකු ගෙන් ලැබිය යුතු මුදල් නොලැබීමේ අවදානම

(2) වැරදි කළමණාකරණ තීරණ නිසා සිදුවන ව්‍යාපාරික අලාභ.

(3) ගොඩනැගිලි ගිනි ගැනීම මගින් සිදු වන අවදානම්

(4) මාර්ගස්ථ මුදල්වලට සිදු වන හානි

(5) ව්‍යාපාරය පාඩු ලැබීම

LIVEWORKSHEETS